# නත්තල් සාදය



දිමාගි අබේකෝන්

# නත්තල් සාදය


දිමාගි අබේකෝන්

කතෘ

මහමායා බාලිකා විදුහල - මහනුවර

6 - G



ප්‍රකාශිත දිනය - 2026.06.13

# පිදුම

මෙම පොත ලිවීමට ආශිර්වාද කළ

දෙමව්පියන්ටත් අනෙකුත් පවුලේ සියලු

දෙනාටත් ගුරුවරුන්ටත් මාගේ ස්තූතිය

පුද කරමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පටුන


| | |
|---|---|
| 01. පළමු දිනය | 01-02 |
| 02. නත්තල් කලින් දිනය | 03 |
| 03. නත්තල් දා සෑදය | 04-05 |
| 04. හිම කුණාටුව මැද නත්තල් තෑගි | 06-08 |
| 05. ප්‍රීතිමත් රාත්‍රිය | 09-10 |

# 01. පළමු දිනය

නත්තල් සමය ආරම්භ වූවා ය. එක් නිවසක යහළුවන් තිදෙනෙක් සහ බලු පැටවෙක් වූවාය. මීනා, ක්‍රිස්ටීන්, රෝසී කියන්නේ එම ගෙදර ජීවත්වන යහළුවන් තිදෙනා ය. "හනී" මේ තමයි ඔවුන් අතර වූ බලු පැටියා. ඔවුන්ගේ නිවස ඉතා අලංකාරය. සීත කාලය නිසා හනී නින්දට වැටිලයි හිටියේ. වැඩක් නැති ඔවුන්ට මීනා අදහසක් දුන්නාය. අපි නත්තලට නත්තල් ගසක් සාදා සරසමු. ඉන්පසු සාලයෙන් තියලා තියමු. මීනා තමයි බාලම කෙනා. රෝසී හා ක්‍රිස්ටීන් එකම වයස. ඔවුන් හරිම එකමුතුයි. මේ රෝසීයි ක්‍රිස්ටීන්නුයි මීනාව හොඳින් බලා ගන්නවා.




නත්තල් ගසේ අවසන් අදියරටම ඔවුන් සියලු වැඩ අවසන් කළහ. කළුවරත් වැටිලා මට හොඳටම බඩගිනියි මීනා කිව්වා ය. මහන්සිත් එක්ක. අද මම කෑම හදන්නම්. ක්‍රිස්ටීන් කිවුවා ය. හා.... හා.... හොඳයි. ක්‍රිස්ටීන් පිළිගැන්වූයේ රෝස්ට් චිකන් සමඟ සෝස් සහ කෝපි වීදුරු එක බැගින්. එන්න අපි කමු. හනී එන්න මේ ඔයාගේ ටික. කෑම කා කෝපි වීදුරුව බීලා නිදියා ගත්හ. එදින අවසන් වූයේ මේසේ ය.



## 02. නත්තලට කලින් දා


ඊළඟ දවසේ උදෑසන කෑම කාලා සියළු දෙනා හිම සෙල්ලම් කිරීමට සූදානම් වූවෝ ය. සීත කබා, අත් පළඳනා, මේස් සහ බූට් පැළඳ හිමට ගියෝ ය. හනී ද කබායක් පැළඳ හිමට ගියේය. හවස් වෙන තුරු හිමේ ටික වේලාවක් ද පලතුරු කැඩීමට ලොකු වේලාවක් ද ඔවුන්ට ගියේය.



ගෙදර ආපු විගසම කෑම කාලා ගෙදර පිළිවෙළට හා පිරිසිදුකර තම තමන්ගේ මේස් එල්ලලා නිදිය ගත්හ.

## 03. නත්තල් දා සාදය

රෝසී සහ ක්‍රිස්ටීන් උදෑසනින් නැගිට මීනාව හා හනීව නැගිටවා මේස් ඇතුල බැලුවා. තිදෙනාගෙම මේස් තුල සූකිරී කොටු තුන බැගින් තිබුණේ ය. ඒ අතරතුර රෝසී කෑම සුදානම් කළා ය. අතුරුපසට චොක්ලට් පුඩින් සහ නෙස්කැෆේ තිබුණේ ය. එන්න අපි කමු. හනී එන්න....



ඉන්පසු රෑ සාදයට කෑම සෑදුවාය. පුඩින්, නෙස්කැෆේ, හිම සමග පැණි ඒ අතරම වුණේය. රෑ බෝවී ගෙන එන විට සාදය සුදානම් වී තිබුණි.

නත්තල් දා සාදය යන කෙටි කතාව සමාප්තයි!

## 04. හිම කුණාටුව මැද නත්තල් තෑගි

ඊටපසු දින හිරු කිරණ හිමවලට වැටී අලංකාරව දිස්වුණේ ය. මීනා, රෝසී, ක්‍රිස්ටීන් සහ හනී උදෑසනම නැගිට කෑම සූදානම් කළා. ඔවුන් කෑම කලා එක් තැනක හිම සුද්ද කර ලස්සන මල් පැල සිටෙව්වේය. සියලු දෙනා පැළ සිටුවා අවසන් ය. දවල් කෑමට ඔවුහු එලය සුදානම් කළෝය. එළියේ ගසක් යට ලොකු රෙදි කැබැල්ලක් එලා ඒ මත කෑම ටික තියා ඔවුන් රවුමට වාඩි වූහ. බිස්කට්, චීස්, පාන්, හැම් ඒ අතර වූයේය. කිරි වීදුරුවත් ඒ සමග තිබුණේ ය.

බාටවත් හනීව අමතක වුනෙත් නැහැ.

ඔවුහු පැය බාගයක් එළියේ ගත කළහ. ඒ පැය බාගයකට කාළගුණය වෙනස් වුණා. සියලු දෙනා ගෙන ආ කෑමත් රැගෙන නිවස තුලට දිව ගියහ. අන්ධකාරය පැතිරී ගිහින් හිම ටිකෙන් ටික වැටෙනවා. තද සුළං හමනවා. මේ එම කාලගුණයේ ලක්ෂණය. ඒ අතරින් පතර හිම යානයක ශබ්දයක් ළඟ ළගම එනවා ඇසුණා. අර බලන්න නැන්දා සහ මාමා. ඔවුන් දෙපලගේ නම් දෙක තමා එලාරා නැන්දා සහ විලී මාමා. ළමයිනේ මේ එන්නේ හිම කුණාටුවක්. ඒක ඇසු ළමයි කලබලයෙන් සීත කබා ඇද, අත් පළඳනා, මේස්, බූට් දමා හනීටද කබාය ඇන්දුවා ය. බය වෙන්න එපා ළමයින්නේ විලී මාමා කිව්වා. ඔන්න අපි ඔයාලට තෑගි ගෙනාවා නැන්දා කිව්වා. ආ.... තව කෑම ටිකකුත් ගෙනාවා. ගන්න ඔයලාගේ තෑගි. හනීටත් තෑග්ගක් ගෙනාවා. ස්තූතියි නැන්දේ මාමේ. ඒ අතරේ රෝසී සියළු දෙනාට කෝපි සූදානම් කළා ය.

ඔන්න ළමයි රෑ කෑම අද මගෙන්, එලාරා නැන්දා කිව්වා. එලාරා නැන්දේ මම උදව් වෙන්නම්කෝ මීනා කිව්වා ය.

හා... හා... හොඳයි එන්නකෝ මට උදව් වෙන්න. ඔවුහු රෑ කෑම සාදා පිළිගැන් වූහ. සියලු දෙනා එකට එක්වී චිලී මාමාගේ විහිලුවට හිනා වෙන ගමන් කෑම කෑවෝය.

## 05. ප්‍රීතිමත් රාත්‍රිය

ඊළඟ දිනයේ චිලී මාමා උදෙන්ම නැගිට හිම යානයේ තිබු කුඩාරම ගෙන නිවසට පහලින් තිබු වත්තේ හිම උඩ එය සාදා ගැට ගසා නිම කළ පසු නිවසේත් මේට්ට ගෙන දර එකතු කර කූඩාරම් අසල දමා නැවත හිම යානයට ගියේය. එයින් කෑම ටිකක් තැබුවා. ළමයි සහ නැන්දා පිබිදුණ හ. ඔලාරා නැන්දා උදේ සහ දහවල් කෑම සැදුවාය. රෑ කෑම ක්‍රිස්ටීන් සහ රෝසි පිළියෙල කළහ. නියුටෙලා සමග පාන් සහ උකු නෙස්කැෆේ, නූල්ඩස් වේ. චිලී මාමා සියලු දෙනාවම කුඩාරමට එක්කන් ගියේය. ඔවුන් පුදුමයට පත් වූහ.



චිලී මාමේ මේ දෙවල් කොහොමද කළේ ? මීනා අසුවාය. මම මැජික් දන්නවානේ

ඇත්තමද මාමේ ? හම්... මීනා. චීලි මාමා හිනාවුණා. ඔන්න ඔහෝම තමයි මේ ප්‍රීතිමත් දවස ගෙවුණේ. ඔයාලා හිතුවේ ඔවුන්ට හනීව අමතක වුණා කියලාද? නැහැ... එක වැරදියි.

නිමි!



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.